*Vidyodaya J., Arts. Sci., Lett., Vol. 11, Nos. 1 & 2, January—July 1983, pp. 27-31.*

# සමාජීය විද්‍යා වාස්ථවිකද නැතහොත් ආත්මීය වේද?

**අභය බණ්ඩාරනායක**

## 1. හැඳින්වීම

පෘථුල වශයෙන් සලකා බැලීමේදී පෙනීයන්නේ විශ්වයේ ප්‍රපංචයන් සහ සිදුවීම් මිනිසා විසින් අත්දැකින ආකාරයන් අවබෝධකර ගැනීමට විද්‍යාව උත්සාහ කරයි. විද්‍යාත්මක ගවේෂණ සිදුවන්නේ විවිධ අංශ තුළින් එම අවස්ථාව සරල කොටගෙන අවබෝධ කරලීම පිණිසය. එම සිදුවීම් ව්‍යාඛ්‍යානය කරලීම මූලික නියමයන් මගින් කරනු ලබයි.

ස්වභාවික විද්‍යාවන්හි එවැනි ව්‍යාඛ්‍යාන හේතුඵලමය ස්වරූපයක් ගනු ලබයි. ස්වාභාවික ලොවෙහි සිදුවීම් අවබෝධ කරගනු ලැබුයේ එවැනි සිදුවීම් අතර පවත්නා සබඳතාවන් ආශ්‍රිතවයි. මෙහිදී ප්‍රශ්නය වනුයේ මිනිස් චර්යාවන් සහ ක්‍රියාවන් සමන්විත වන්නා වූ සමාජී විද්‍යා විෂය ක්ෂේත්‍රයන් ද එලෙසම හේතුඵල සහ නියමයන් තුළින් කරනු ලබන ව්‍යාඛ්‍යානයන් තුළින් විමසිය හැකි ද යන්නයි. එලෙස හේතුඵල සබඳතාවන් සමාජී විද්‍යා තුල දැකිය හැකිනම් එම විෂයය ක්ෂේත්‍රය ද නියම විද්‍යා ගණයට වැටේ. මෙම ගැටළුව දර්ශනිකයන් තුළ මෙන්ම සමාජී විද්‍යාඥයන් තුළ ද වාදයකට තුඩුදුන්නකි.

මෙම ලිපියෙන් උත්සාහ දරනු ලබන්නේ මෙලෙස වාදයකට තුඩුදුන් මෙම විෂය ක්ෂේත්‍රය තුළ පවතින්නේ වාස්ථවිත වශයෙන් දැකිය හැකි ඇගයුම් ද නැතහොත් අත්මීය වශයෙන් හෙවත් සාපේක්ෂක වශයෙන් සිදුවීම් හි ස්වභාවයක් පවත්නේද යන්න විමසීමටය. මේ පිළිබඳ ව පවත්නා විවිධ අදහස් තුළින් සමාජී විද්‍යා නිගමන හා අදහස් නියති විද්‍යා නිගමන හා නියමයන් හා සමතැන් ගන්නේ ද යන්න විමසීමට අදහස් කෙරේ.

## 2. ගැටළුවේ ස්වභාවය

දර්ශනිකයන් මෙන්ම සමාජී විද්‍යාඥයන් ද එම විෂය ක්ෂේත්‍රයන්ගේ සන්දර්භයන් පිළිබඳව විවිධ මතිමතාන්තර ඉදිරිපත් කර ඇති බව පෙනේ. සමාජී විද්‍යාඥයන් රැසක් විසින් ම උත්සාහ ගෙන ඇත්තේ සමාජී විද්‍යා විෂය ක්ෂේත්‍ර තුළ පවත්නා ඇගයුම් හි ස්වභාවයන් පිරික්සීමටය, එනම්, එමගින් ගෙන එන කරුණු වාස්ථවික සිද්ධාන්තයන්ගෙන් සමන්විත ද නැතහොත් ආත්මීය හෙවත් සාපේක්ෂක සිද්ධිවාචක යන්ගෙන් සමන්විත ද යන්න සෙවීම සඳහාය. මෙම සංකල්පය මූලික වශයෙන්ම ඉදිරිපත් කරනු ලැබුයේ මැක්ස් වේබර් (1949) විසිනි. මෙම මතය දරණ ප්‍රධාන සම්ප්‍රදයානුකූල චින්තකයන් අතර මොහු ප්‍රධාන තැනක් දරනු ලබයි. වේබර් ප්‍රධාන වශයෙන් අදහස් දෙකක් දරනු ලබයි. එකක් වනුයේ අධිභෞතික සහ තර්කශාස්ත්‍රානුකූල මතයයි. අනෙක ප්‍රායෝගික අදහසයි. මේ අතර ප්‍රථමයෙන් ම වෙන් කොට දැකිය හැකි කොටස් දෙකක් පවතී. එනම් සිද්ධිවාචක අංශය සහ ඇගයුම්ශීලී අංශයයි. සිද්ධිවාචක ගෙන එන ප්‍රකාශන සහ අගයුම් ප්‍රකාශිත ප්‍රකාශන අතර තාර්කිකමය වශයෙන් වෙනසක් පවතී. සිද්ධිවාචක අංශය සියළු විද්‍යා ක්ෂේත්‍රයන්හි විෂය ක්ෂේත්‍රවේ. එය භෞතික හෝ සමාජී විද්‍යා විය හැකිය. විද්‍යා ක්ෂේත්‍රය තුළදී සිද්ධිවාචක දැකිය හැකිවන්නකි. එනම් විනිශ්චය තුළ දැකිය හැකි ප්‍රභවයන් මොනවාද? එම අංශ අතර පවත්නා නියමයන්හි ස්වරූපය කවරේද? යනාදියයි. එම

කරුණුවලට බාහිරව අගයුම්ශීලී ප්‍රකාශ වනුයේ දෙන ලද අවස්ථාවකට අනුව කටයුතු කළයුතු වනුයේ කෙසේද? කිසිවකු යමක් නීම කිරීම කෙසේ කළයුතු ද? යනාදිය සැලකේ. වෙබර්ගේ අදහස වූයේ කිසිවකු අගයුම්ශීලි ප්‍රකාශන විද්‍යාත්මක ලෙස ගෙන ඒවා පෙන්වා දීමට උත්සාහ නොගත යුතු බවයි. එනම් එය එසේ සිදු නොවන හෙයිනි.

විවිධ විෂය ක්ෂේත්‍ර තුළ පවත්නා විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ නිවැරදි අවබෝධ නොමැති වූ විටදී මෙවැනි දුෂ්කරතාවනට මැදිවන බව ඔහුගේ අදහසයි. කිසියම් ප්‍රකාශනයක පවත්නා තාර්කික ස්වරූපය හඳුනාගැනීම වැදගත්ය. වෙබර්ගේ අදහස වූයේ විද්‍යාත්මක ඥනය යනු සිද්ධිවාචක පිළිබඳ ඥනයයි. (knowledge of facts) එය අගයුම් පිළිබඳ ඥනය නොවේ. ලෙස්නොෆ්ගේ (1974) මතය වූයේ සිද්ධිවාචකමය දැනුම අගයුම් කළහැකි බවත්, එය කුමන සිද්ධිවාචකයින් ඒ අතරින් ග්‍රහනය වේද යන්න පිළිබඳව අදහසක් නොපවතින බවයි. මෙම ප්‍රකාශනයෙන් කියවෙනුයේ ස්වාභාවික වශයෙන් ම විද්‍යාත්මක ක්‍රම හා පර්යේෂණ ආදිය සිද්ධිවාචක ගවේශණයේදී පිලිපැදිය යුතු බවයි. විද්‍යානුකූල අගයුම් විනිශ්චයන් යන ක්‍රම විද්‍යාවෙහි ඇගයීම සහ අනුමාන සාක්ෂි අගැයීම ආදිය විද්‍යාවේ ක්‍රම ශිල්ප අතර වැදගත් නියමයෝ වෙති. එහෙත් අගැයුම්ශිලි ප්‍රකාශන එම විද්‍යා ක්ෂත්‍රෙයන්හි නිමැවූ මේ අංගයන් නොවේ. සමාජී විද්‍යා වුවද ඇත්ත වශයෙන් ම මිනිස් ක්‍රියා පිණිස වූ ඒවා ලෙසම සැලකිය නොහැක. සමාජී විද්‍යාඥයන් මිනිස් අගැයුම් තම විෂය ක්ෂේත්‍රයට හසුකොට ගනී. එහෙත් සමාජී විද්‍යාත්මක ඇගැයුම් පමණක් ම තම විෂය ක්ෂේත්‍ර සඳහා යොමු කොට ගතයුතු යයි නිගමනය නොවේ.

### 3. වාස්ථවික සිද්ධිවාචක සහ වේබරියානු වාදය

සමාජී විද්‍යා වාස්ථවිකයයයි යන මතයට එරෙහිව විවිධ දර්ශනිකයන් සහ වියතුන්ගේ අදහස් ඉදිරිපත් විණි. වේබර්ගේ මතය වූයේ කිසියම් අගැයුම් විනිශ්වයක වැරදි බව හෝ නිවැරදි බව සිද්ධිවාචක ප්‍රකාශනයක සත්‍ය හෝ අසත්‍යතාවය සඳහා නොඅදළ බවයි. මිර්ඩාල් (1949) දක්වූ අදහසක් මෙහි දී සඳහන් කිරීම වටී. ඔහුගේ මතය වූයේ මෙවැනි සිදුවීම් සිදුවන එක් පොදු අවස්ථාවක් සඳහන් කළහැකි බවයි. එනම් සිද්ධිවාචක විනිශ්වයන් වැරදි ලෙස නිරූපනය කිරීමක් විවිධ අගයුම් විනිශ්වය අතර පවත්නා ගැටුම් නිසා ඒවා පිළිගැනීමට ඇති අකමැත්ත මත සිදුවිය හැකිය. ඔහු උද හරණයක් දක්වමින් පෙන්වා දී ඇත්තේ සුදු ජාතික ඇමෙරිකානුවන් සමග අයිතිවාසිකම් හා සමානතාව හා මූලධර්මය පිළිබඳව විශ්වාසය තැබූවන් නිග්‍රෝ ජාතිකයන් හැකියාවෙන් හීන කොටසක්ය යන අදහසක් ඔවුන් කෙරෙහි දක්වීමට පෙළඹූනේ ඔවුන් අතර පැවතුනු අගයුම් විනිශ්වයන්ගේ ගැටුම් හේතු කොට ගෙනය. මෙය මෙසේ වනුයේ ඔවුන් නිවැරදිය යන මතය සුදු ජාතිකයන් තවදුරටත් තහවුරු කිරීම නිසාය. මේ අතරම තවත් අයෙකු මෙම සමාන අවස්ථා අයිතිය පිළිබඳ විශ්වාස කරනු ලැබූවකු මෙම ජාතීන් දෙකටම සමාන ලෙස සැලකිය යුතු බවට අදහස් දක්වති. මෙවැනි අදහසක් ගම්‍යකර ගනු ලබූයේ අගයුම්ශීලි පූර්ව අවයව දෙකක් ආධාර කොට ගෙනය. එනම් සුදු ජාතිකයන් සහ නිග්‍රෝ ජාතිකයන් යන කොට්ඨාශ දෙකම හැකියාව අතින් සමානය යන සිද්ධිවාචක ප්‍රතිජානනය කිරීමෙනි. මේ හා සමානව ගැටුම් සහිත සිද්ධිවාචක ප්‍රජනනයන් සමාජී විද්‍යා ක්ෂේත්‍ර තුළ දී නිතරම සිදුවන බව පෙනේ. එංගල්ස් (1960) මූලික විසංවාදයන් යනුවෙන් ඔහු අංශ දෙකක් දකී. එනම් පළමුවෙන් කියවෙනුයේ සාමාන්‍යය සිදුවීම් අසාධාරණය (අගයුම් විනිශ්වය) එනම් වැටුප් උපයන්නන් ධනපතියන් අතර ගැටුම් ඇතිවේ. එම ගැටුම් සඳහා හේතු වූයේ ඔවුන්ගේ අදක්ෂතායි. (සිද්ධිවාචකමය, විනිශ්වයන්) මෙවැනි ප්‍රතිජානයන් සඳහා විරුද්ධතාවයන් දක්විය නොහැකිය. චාර්ල්ස්

ටේලර් -(1967) විසින් සමාජි විද්‍යා ක්ෂේත්‍ර තුළ පවත්නා සිද්ධිවාචක සහ අගයුම් පිළිබඳව මූලික විවේචනයන් දක්වූවෙක් ලෙය සඳහන් කළහැකිය. එහෙත් වෙබර් දක්වූ මෙම වෙනස සඳහා හෝ සමාජි විද්‍යාවන්හි වාස්ථවික බව සඳහා සුදුසු සාක්ෂි ඉදිරිපත් කිරීමක් කැර ඇති බවක් නොපෙනේ.

## 4. වාස්ථවික සිද්ධිවාචක හා සමාජ විද්‍යා

සදචාරය පිළිබඳව වේබර් දක්වන අදහස් සමාජි විද්‍යාවන්හි පැවතිය යුතු වාස්ථවික බව සඳහා තිබූ ගම්‍යතාවයන් නොදක්වයි. කිසියම් මූලධර්මයක් හෝ එවැනි විනිශ්චයන් නිවැරදිය යන ගම්‍යතාවය ඉවත් කිරීමක් මෙම වාදය මගින් නොකෙරේ. එය පූර්ව ලෙස ඇගයුම් ගම්‍ය කරනුයේ එවැනි දේවල නිවැරදි බව බුද්ධිමය ලෙස ප්‍රදර්ශනය කළ නොහැකි බවයි. ක්රුණු එසේ නම් සදචාරමය සංකල්ප විද්‍යාත්මක ක්‍රම උදෙසා නොගැලපේ. ඒ අනුව අගයුම් වලින් තොර වාදයන් (වාස්ථවික බව) සදචාරමය, අවස්ථා සඳහා උපකාරී නොවේ. එසේම මෙයින් ගම්‍යවනුයේ දේශපාලනඥයන් වුවද, යුක්තිය සාධාරණත්වය පිළිබඳ කලබල වීමට හෝ කණගාටුවට පත්වීම නොවිය යුතු ය. එමෙන් ම සමාජි විද්‍යාඥයන් ද නරක ක්‍රියාවන්හි නියුක්ත වුවත් එවැනි දේ වලින් වැළැක්වීම පිළිබඳව උපදෙස් දීමට ද අවශ්‍ය නොවේ. මෙම අගයුම්ශීලී බවින් තොර වාදය සදචාර නාස්තිවාදයක් ගම්‍යය නොකෙරේ. නම් එය සදචාර නිශ්ඨාවන් ප්‍රබල කරවන්නක් විය යුතු ය. එහෙත් එය පැහැදිලි නොකෙරේ රයන් (1970) වැනි අයගේ අදහස් වනුයේ විශ්වාසය විවිධ ලෙස පවතින බවත්, විශ්වාසනීය ලෙස පවතින සත්‍යයක් අපට නොදැකිය හැකි බවයි. එසේ සංස්කෘතියෙන් සංස්කෘතියට විශ්වාශ යන ආකල්ප වෙනස් වේය යනුවෙනි.

ගෝල්ඩ්නර් (1964) අදහස වනුයේ අගයුම් වලින් තොර සමාජි විද්‍යා වක්‍රව හෝ යථාත්වයෙන් යුතුව සමාජි උපද්‍රාවක් හෝ අගයුම් කිරීමක් උසලනු ලබන බවයි. වෙබර්ගේ අදහස පිළිබඳව කරුණු දක්වන සමාජී විද්‍යාඥයින් සහ මාක්ස්වාදීන් පෙන්වා දී ඇත්තේ වෙබර්වාදය ඇත්ත වශයෙන්ම යථාර්ථවාදය විවේචනය කිරීම හෙලා දුටු එමෙන්ම එය විද්‍යාත්මක නොවේ යයි කියූ පශ්චාත්ගාමී වාදයක් බවයි. එහෙත් ලෙස්නජ් (1974) මෙය සාධාරණ විවේචනයක් ලෙස පිළි නොගනී. එය සත්‍යය නම් අගයුම්ශීලී විනිශ්චයන් හී පවත්නා විද්‍යාත්මක තත්ත්වයක් නැතැයි කියන මතය ආත්ම විශ්වාසයකින් යුතුව අඩුවිය යුතුයි. මෙය පැහැදිලිවම මනෝවිද්‍යාත්මක සිද්ධිවාචකය කි. එහෙයින් එය ප්‍රතික්ෂේප කිරීම වැරදි ලෙස ගෙන ඇතැයි යන්න එමගින් ගම්‍ය නොවේ.

## 5. වාස්ථවිකතාවය සහ අගයුම්ශීලි විනිශ්චයන්

සමාජි විද්‍යා විෂයයන් අගයුම්ශීලි බවත්, එය අගයුම්ශීලි බවින් තොරවම තාර්කික වශයෙන් විය නොහැකි බව ලියෝ ස්ට්‍රවුස් (1953) වැනි අයගේ මතයයි. ඔහුගේ මතය වනුයේ සමාජි විද්‍යා අගයුම් රහිත විය නොහැකි බවයි. නැතහොත් අගයුම් සහිත බවයි. එම අගයුම් පුද්ගලයාගේ ආත්මීය ගවේශණයකට අදළ අගයුම් නොව කිසියම් වාස්ථවික පදනමක් මත සකස් වූ අගයුම් බව ඔහු සඳහන් කරයි. කිසියම් සමාජි ප්‍රභවයන් මෙලෙස ආත්මීය අගයුම මත නිර්වචනය කළ නොහැක. මානව ප්‍රභවයන් දෙස අගයුම් විනිශ්චයන්ගෙන් තොරව මිනිසාට අවධානය යොමු කළ හැකිය. අප සමාජය තුළ දී කරනුයේ ප්‍රශ්නයකට පිළිතුරු සැපයීමය. එම පිළිතුරු අගයුම් විනිශ්චයන් ලෙස අප දකිමු. එවැනි සප්‍රමාණ පිළිතුරු අප තර්කානුකූලව රීති මත

තීරන කරමු. එවැනි ප්‍රශ්න රඳා පවතිනුයේ පුද්ගලයන්ගේ අගයුම් මතය. එවැනි ආත්මීය ප්‍රශ්නයක් සඳහා ලැබෙන පිළිතුරු වාස්ථවික හෝ ආත්මීය විය හැකිය. අප ගෙන් අසන ප්‍රශ්නයත් ඒවාට දෙන පිළිතුරුත් පුද්ගලයාගේ අගයුම් මත රඳා පවතී. මින් පැහැදිලි කලේ අප හුදු සිද්ධිවාචික ලෙස ගනු ලබන සමහර කරුණු අපගේ සංස් කෘතික රටාව මත ආරෝපිත වූ විශ්වාස මත සැකසුනු සමාජීය වශයෙන් ආත්මීය දේ විය හැකි බව පෙන්වා දෙයි.

රුඩ්නර් (1953) වැනි චින්තකයන්ගේ අදහස වූයේ කිසිම විද්‍යාවක් අගයුම් විනිශ්චයන් ගෙන් තොර විය නොහැකි බවයි. එලෙස අගයුම් වලින් තොරව විමසීමක් කළ නොහැක. සෑම විද්‍යා ක්ෂේත්‍රයකටම අගයුම් විනිශ්චයන් පවතින බව ඔහු පිළිගත්. මෙම අදහස තහවුරු කරලීම සඳහා ඔහු සඳහන් කරනු ලබන්නේ සෑම විද්‍යාඥයකුම අගයුම් විනිශ්චයන් ගොඩනගා ගතයුතුය යන්නයි. විද්‍යාඥයකු තම පරීක්ෂණයකට යොමු කළ උපන්‍යාසයක් පිළිගනු ලබන්නේ එම උපන්‍යාස තහවුරු කරලීම පිණිස ලැබුණු සාක්ෂි පදනම් කොට ගෙනයි. එම පරීක්ෂණයකදී විද්‍යාඥයා කිසියම් තිරණයක් ගනු ලබයි. එම තීරණය රඳා පවතින්නේ එම උපන්‍යාසය පිළිගැනීමට අදළ සාධක සෑහෙන සම්භාව්‍ය තාවයකින් යුක්තව පැවැතීම අනුවය. විද්‍යාඥයකුගේ එම තීරණය අගයුම්ශීලී විනිශ්-චයකි. බොහෝ අනුභූතිවාදීන්ගේ මතය වනුයේ කිසියම් උපන්‍යාසයක් පිළිගැනීම හෝ බහිෂ්කරණය අනිවාර්යෙන්ම අගයුම් විනිශ්චය සමග සම්බන්ධ වන බව සඳහන් කරයි.

අර්නස්ට් නේගල් (1961) අගයුම් වලින් තොර සංකල්පීය අදහසක් තරයේ හෙලා දකින අතර, සමාජීය විද්‍යා ක්ෂේත්‍රයන්හි නිශ්ක්‍රිය අගයුම්ශීලී බව විය නොහැක්කක් බව සඳහන් කරයි. සමාජී විද්‍යාඥයකුගේ අවධානය යොමු වන බොහෝ දේ තීරණය වනුයේ සමාජමය වශයෙන් වැදගත් අගයුම් හේතු කොට ගෙනය. උදහරණයක් ලෙස මානව කටයුතු පිළිබඳ උනන්දුවක් දක්වන ශිෂ්‍යයකු ඒ සඳහා සංස්කෘතික ලක්ෂණ ආදී දේ ඒ සඳහා යොදවා ගනී. මෙවැනි අගයුම් පදනම් කොට නොගෙන එවැනි ගවේෂණයක් කළ නොහැකි වන්නකි. නේගල්ගේ තර්කය වනුයේ අගයුම් විනිශ්චයන් යම් යම් පුද්ගලයන්ගේ තෝරාගැනීම් මත රඳා පවතින බවයි. වරනයන් සහ අගයුම් විනිශ්චයන් අතර වෙනසක් ඔහු නොදනී. සමාජී විද්‍යාඥයන් කරනුයේ කිසියම් සමාජ ප්‍රභවයක් විග්‍රහ කිරිම උදෙසා තමා උසුලන අගයුම් ඒ කෙරෙහි ආරෝපනය කිරීමකි. සිද්ධිවාචක සහ අගයුම් අතර වෙනසක් නොදැකිය හැකි පරිදි සබඳතාවක් පවතී. එසේම අගයුම් විනිශ්චයන් ඒවායින් ඈත් කළ නොහැක. එසේ කළ හැක්කේ විද්‍යාවන් සියල්ලම නොපවතී නම් පමණි. නේගල් අගයුම් වලින් තොර සාමාජි විද්‍යාහෝ විද්‍යා ක්ෂේත්‍රයක පැවැත්මක් පිළිබඳ අදහසක් නොදරයි.

ඉහත සඳහන් කරුණු වලින් පෙනීයනුයේ සමාජී විද්‍යා විෂයයන්හි ව්‍යාස්ථාවික බව සහ ආත්මීය බව පිළිබඳව තීරණාත්මක නිගමන කරා සමාජී විද්‍යාඥයන් හෝ දර්ශනිකයන් එළඹී නොමැති බවයි. එනම්, එම විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව ගැටළු සහගත අදහස් දරණ බවයි. ඔවුන්ගේ ප්‍රධාන අදහස වූයේ සමාජී විද්‍යා අගයුම් විනිශ්චයන්ගෙන් සමන්විත ඒවා මිස සිද්ධිවාචක වලින් තොර බවකි. මෙම කරුණු කෙසේ වෙතත් නිවැරදිව පෙනෙනුයේ ඕනෑම විද්‍යා ක්ෂේත්‍රයක වර්ධනය සඳහා අගයුම් විනිශ්චයන් මෙන්ම ආචාර ධර්ම පද්ධතියක අවශ්‍යතාවයක් පවතින බවයි. මෙම අදහස් අතර විවිධ සංදිග්ධතා පවතින නමුත්, මහාචාර්ය ෆ්‍රැන්ක්ලින් (1979) අදහස් කරනුයේ සමාජී විද්‍යා ක්ෂෙත්‍රය තුළ පවත්නා එවැනි සංදිග්ධතාවන් විසඳා ගැනීමට එම විමර්ශනයන් තුළින් නොහැකි නොවේ ය යනුයි.

සමාජ විද්‍යා ක්ෂෙත්‍ර තුළ පවත්නා හෝ තිබිය යුතු වාස්ථවික බව හෝ අගයුම්ශීල බව එම විෂය ක්ෂේත්‍රයට අවශ්‍යවන්නකි. විද්වතුන් විවිධ අන්දමින් මේ පිළිබඳව ඉදිරිපත් කර ඇති අදහස්වලින් ගම්‍යවනුයේ මෙම ගැටළු දීර්ඝ විමර්ශනයකට යොමු කළයුතු බවකි. ඇත්ත වශයෙන්ම ප්‍රායෝගික වශයෙන් බැලූ විට දී සමාජ විද්‍යාවන් තුළින් අප එළඹෙන නිගමන බොහෝ විට සම්භාවතාවයන්ගෙත් යුත් අගයුම්ශීලි නිගමන සේ පෙනී යයි. එවැනි නිගමන කරා එළඹෙන පූර්ව අවයවයන්ගේ ප්‍රමාණය මත ඒවා වාස්ථවික හෝ ආත්මීය ස්වරූපයක් දැරිය හැකිය. මෙයින් ගම්‍ය වනුයේ සමාජ විද්‍යා කවර පදනමක් මත හෝ වාස්ථවික හෝ ආත්මීය ලෙසම නිගමනය කළ නොහැකි බවය.

## REFERENCES


Engles F. (1960) Socialism Utopian and Scientific in the essential life. Allen & Unwin.

Franklin R.L. (1978) Enquiry in Social Science hand book, Part x, University of New England.

Gouldner. A. W. (1964) Anti-Minotour. The myth of a value free Sociology in I. C. Horwritz (ed). The new Sociology. Oxford University Press.

Lesnoff M. (1974) The structure of Social Science. George Allen and Unwin. London.

Myrdal G. (1949) An American Dilumina. The negro problem in modern democracy. Harper and row 2nded. New York. Harper and Brothers.

Nagel. E. (1961) The strucutre of Science. Harcourt Brace and World. New York.

Ryan Alan (1970) The Philosophy of Social Sciences. The Mc Milan Press. London.

Rudner R. (1953) The Scientist que scientist make value judgements. The Philosophy of Science. Journal - 20.

Strauss Lee (1953) Natural fight and History. Chicago University Press.

Taylor Charles (1967) Neutrality in Political Sciences in P. Laslett and W. G. Runcima. (eds.) Philosophy Politics and Society 3rd series. Blackwell Oxford.

Weber Max (1949) The meaning of ethical Neutrality in Sociology and economic in the Methodology of the Social Sciences, Free Fress. New York. Essay 1.